චක්‍රලේඛ අංක :- 2018/17

මගේ අංකය - කේ 05/චක්‍රලේඛ/17/2018
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2018.11.28වන දින

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්

**බන්ධනාගාර ගත රැඳවියන් විවිධ උපක්‍රම උපයෝගී කරගනිමින් බන්ධනාගාර අත් අඩංගුවෙන් පැනයාමට තැත්කිරීම සම්බන්ධවයි.**

රැඳවියන් බන්ධනාගාරයෙන් පිටත ආරක්ෂණය කිරීමේදී හා අධිකරණයට ඉදිරිපත් කිරීම, බන්ධනාගාරයෙන් බැහැර නේවාසික ප්‍රතිකාර ලබන අවස්ථාවන්, රෝහල් සායන හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා බැහැරට ගෙනයාමේදී රැඳවියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමර්ගයන් සම්බන්ධයෙන් බන්ධනාගාර ආඥාපණත, ව්‍යවස්ථාපිත නීති රෙගුලාසි , බ.කො. ජ. චක්‍රලේඛ සහ දෙ.නි.නි වල දක්වා ඇති නියෝගයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරවමි.

තවද, කලින් කලට ඇතිවන තත්වයන් අනුව දෙපාර්තමේන්තුව මගින් රැඳවියන්ගේ පිටත ආරක්ෂණ සංවිධානයන් කෙරෙහිද නිකුත් කර ඇති සියළු දෙපාර්තමේන්තු චක්‍රලේඛයන් කෙරෙහිද ඔබගේ දැඩි අවධානය යොමු කර කටයුතු කරන මෙන් දන්වමි.

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 200/27, කේ05/මාරු කිරීම්/2006 හා 2006.06.12 දිනැති ලිපිය, කේ/04/ආරක්ෂණ හා 2005.10.04 දිනැති ලිපිය, දෙපාර්තමේන්තු චක්‍රලේඛ 20/2014,දෙපාර්තමේන්තු චක්‍රලේඛ 21/2015, දෙපාර්තමේන්තු චක්‍රලේඛ 10/2017 හා ඊට සමාන්තර නියෝග හා උපදෙස් සහිත සියළුම චක්‍රලේඛයන් සම්බන්ධයෙන් මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්ගේ සහ සහකාර අධිකාරීවරුන්ගේ වගකීමක් බවට දන්වමි.

මහාපරිමාන හෙරොයින් ජාවාරමට සම්බන්ධව රැඳවියන්, නමගිය පාතාල කල්ලි සාමාජිකයින් පිළිබඳව සහ විශේෂ සිද්ධීන් සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වන සිර/සැකකරුවන්ගේ නඩු පවත්නා අධිකරණ, එම නඩු සංඛ්‍යාවන්, වෙනත් ආයතන වෙත මාරු කිරීම් වලදී ලබාදෙන ආරක්ෂාව පිළිබඳව මනා අවබෝධයක් හා දැනුවත්භාවයක් ආයතන අධිකාරී/සහකාර අධිකාරීවරුන් වෙත තිබිය යුතුය. කුමන හෝ හේතුවක් මත ආරක්ෂණයක සිර/සැකකරුවන් අතරමගදී භාර ගැනීම භාරදීම සිදු නොකල යුතු අතර, සෑම විටම එම කටයුතු බන්ධනාගාරයක් හරහා නිවැරදිව ලේඛණගතව සිදුවිය යුතුය. අතිවිශේෂ අවශ්‍යතාවයන් හිදී පෙර අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන්න.

මහාපරිමාන හෙරොයින් ජාවාරම සම්බන්ධ , නමගිය පාතාල ක්‍රියාකාරීන්, හා වෙනත් විශේෂ නඩු සඳහා සම්බන්ධ සුවිශේෂී සිර/සැකකරුවන් පැනයාමට නොහැකි වන පරිදි සියළුම ආරක්ෂක සංවිධාන නිරීක්ෂණය කිරීම හා සුදුසු පියවරයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සෘජු වගකීම ආයතන අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් වෙත පවරමි.

ඉදිරියේදී මෙවන් ආකාරයේ පැනයාම් සම්බන්ධයෙන් මූලික විමර්ශණ සිදු කිරීමේදී ආයතන අධිකාරී/ සහකාර අධිකාරීවරුන්ගේ රාජකාරී ක්‍රියාකලාපය හා වගකීම් සම්පූර්ණ කර ඇතිද යන්න සම්බන්ධයෙන්ද අවධානය යොමු කිරීමට කටයුතු කරන බවත්, තම රාජකාරී වගකීම් පැහැර හැර ඇති බවට නිරීක්ෂණය වන අධිකාරීවරුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බවට අවධාරණය කරමි.

එච්.එම්.එන්.සී ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ - 09.**